Manathunga, Dammika Kumari
PAPER

# අට්ඨකථා සාහිත්‍යය ඇසුරින් පැරණි භාරතීය රජපෙළපත් හා නගර හඳුනා ගැනීම (ක්‍රි.පූ. 7 වන සියවස සිට 6 වන සියවස දක්වා)

ධම්මිකා කුමාරි මනතුංග, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

D.K. Manathunga, Department of History, University of Kelaniya

අට්ඨකතා හෙවත් අටුවා යනු විනය සූත්‍ර අභිධර්ම යන ත්‍රිපිටකට අයත් ග්‍රන්ථවලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. මේවා ලිවීමේ පරමාර්ථය වූයේ ඇතැම් වචන සහ බුද්ධ ධර්මයේ ගැඹුරුතැන් විස්තර කිරීමත්, අවශ්‍ය තැන්වලදී ඒවා සඳහා විස්තරාර්ථ සැපයීමත් ය. මෙම පරමාර්ථය පෙරදැරි කරගෙන ලියන ලද හෙළටුවා වන්නේ මහා අට්ඨකථා, කුරුන්දි අට්ඨකතා හා පච්චරිය අට්ඨකතා ය.

ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයාගේ අනුග්‍රහයෙන් මොග්ගලීපුත්ත තිස්ස මහරහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවති තුන්වන ධර්මසංගායනාවෙන් පසු මිහිඳු මහරහතන්වහන්සේ විසින් එකී සංගායනාවේ දී සංග්‍රහ කළ ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබී ය. ශ්‍රී ලංකාවේ දෙවනපෑතිස්ස (ක්‍රි.පූ. 250-210) රාජ්‍ය කාලයේදී මෙරටට රැගෙන එන ලද එකී පාලි ත්‍රිපිටකය මහා අරිට්ඨ මහරහතන්වහන්සේ ප්‍රමුඛ සිංහල භික්ෂූන්වහන්සේ උගත්හ. මේ පාලි ත්‍රිපිටකයේ තිබූ ගැටළු තැන් සිංහල ජනතාවට පැහැදිලි කර දීමට අවශ්‍ය වූ බැවින් සිංහල භික්ෂූන්වහන්සේ සිංහල බසින් අර්ථ විවරණ කළහ. හෙළ අටුවා නමින් හඳුන්වන්නේ මෙම ග්‍රන්ථයි.

ත්‍රිපිටකයට අර්ථ විවරණ සැපයූ මේ අට්ඨ කතා සමූහය ඉතිහාස ගත තොරතුරු හැදෑරීමෙහිලා අතිශයින් වැදගත් වෙයි. විශේෂයෙන් ඉන්දියානු ඉතිහාසයෙහිලා මෙයින් ලැබෙන පිටිවහල ප්‍රමාණය කළ නොහැකි තරම් ය. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, පැරණි ඉන්දියානු ඉතිහාසයට සම්බන්ධ රජපෙළලත් හා නගර කිහිපයක් අට්ඨකතා ඇසුරින් ගොඩනගා ගැනීමයි.

මුඛ්‍ය පද - අට්ඨකතා, සංගායනා, ඉන්දියානු ඉතිහාසය